සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/SW/14/19/01-Circular | ඔබේ අංකය / உமது இல / Your No: ........................ | දිනය / திகதி / Date: 2021.03.02 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් /ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි කළමණාකරුවන්/සමෘද්ධි සංවර්ධන නිළධාරින් වෙත,

## <u>සමෘද්ධි සහනාධාරය සඳහා සුදුසුකම් ලබන පවුල් තෝරාගැනීම.</u>

සමාංක දරණ 2021/02/11 දිනැති උක්ත ශීර්ෂය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති සමෘද්ධි චක්‍රලේඛ 2021/03 හා බැඳේ.

02. එම චක්‍රලේඛයේ 15 වන ඡේදයේ **"සමෘද්ධි රන්පත්ලාභී" (Gold Card)** කණ්ඩායම් හඳුනාගැනීම යටතේ ආර්ථිකමය අතින් මේ වනවිට සවිබලගැන්වී මාසික සමෘද්ධි සහනාධාර වැඩසටහනෙන් ස්වේච්ඡාවෙන් ඉවත්ව සිටින සහ යෝජිත සවිබලගැන්වීමේ ක්‍රියාවලිය තුළින් ස්වකැමැත්තෙන් ඉවත්ව යන පවුල් වෙනුවෙන් ඔවුන්ගේ ජීවනෝපාය කටයුතු තවදුරටත් සංවර්ධනය කර ගැනීම සඳහා 5% ක පොළී අනුපාතිකයක් යටතේ උපරිම රුපියල් ලක්ෂ පහ (රු. 500,000/-) දක්වා ණය මුදලක් ලබාදීමට උපදෙස් ලබාදී ඇත.

03. තවද, 2021/02/22 දින හා DSD/HO/04/LH/Circular/2021 අංක දරණ සමෘද්ධි චක්‍රලේඛ අංක 2021/05 යටතේ වූ **"සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (200,000) කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන"** තුළ මෙලෙස ස්වේච්ඡාවෙන් සවිබල ගැන්වෙන හා ඉදිරියේදී මෙම වැඩසටහන යටතේ සවිබල ගැන්වීමට කැමැත්ත දක්වන ප්‍රතිලාභීන් සඳහා රුපියල් ලක්ෂ පහක (රු. 500,000/-) ණය පහසුකම් වෙනුවෙන් හඳුන්වාදී ඇති පොළී අනුපාතය 4% ක් වේ.

04. ඒඅනුව, සමෘද්ධි සහනාධාර සඳහා සුදුසු පවුල් තෝරාගැනීම වෙනුවෙන් නිකුත් කර ඇති 2021/03 දරණ චක්‍රලේඛයේ 15 වන ඡේදයේ සඳහන් 5 % ක පොළී අනුපාතිකයද 4 % ක් ලෙස සංශෝධනය වියයුතු බව අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ උපදෙස් පරිදි මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| **එච්. කේ. රණවීර** | **අ/කළේ :-** | **ආර්. පී. බී. තිලකසිරි** |
| අධ්‍යක්ෂ, සමාජ ආරක්ෂණ හා සුභසාධන (වැ.බ.) | | අධ්‍යක්ෂ ජනරාල් |

**පිටපත් :-**

1. රාජ්‍ය ලේකම් , සමෘද්ධි, ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා, ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය. - කා.දැ.ස
2. විගණකාධිපති,විගණකාධිපති දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
3. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ස.
5. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ. ක.ස.